Australian Children's Education & Care Quality Authority

Sinhalese

# ජාතික ගුණාත්මක රාමුව

(National Quality Framework)

## NQF මගින් ඔබට ඇති වැදගත්කම කුමක්ද?

බාල ළමාවිය අධ්‍යාපනය සහ රැකවරණය සඳහාවූ ජාතික ගුණාත්මක රාමුව (NQF) මගින් ඔබගේ දරුවා හට ජීවිතයේ ලබාදිය හැකි හොඳම ආරම්භය ලබාදීමට උපකාර කරන බවට තහවුරු කෙරේ.

NQF සතුව දිගු දිවා රැකවරණ (long day care), පවුල් දිවා රැකවරණ (family day care), පෙර පාසැල් (preschools), පහළ බාලාංශ (kindergartens), සහ පාසැල් වේලාවෙන් පිටත රැකවරණ සේවා යන සියළු සේවාවල අධ්‍යාපන සහ රැකවරණ තත්වය වර්ධනය කිරීමට නව ගුණාත්මක සම්මතයන් ඇත.

## පවුල් සඳහා ඇති ප්‍රතිලාභ

- ළමුන් සඳහා තනි තනියෙන් වඩා වැඩි වශයෙන් ලබාදෙන රැකවරණය සහ අවධානය
- ළමුන්ගේ ඉගෙනීම සහ වර්ධනය සම්බන්ධ වැඩිපුර උපකාර ලබාදීම
- වඩා වැඩි කුසලතා සහ සුදුසුකම් සහිත ශික්ෂකයන්
- බොහෝ සේවාවල ශික්ෂකයන් සහ ළමුන් අතර වඩා හොඳ අනුපාතයක් තිබීම
- අධ්‍යාපන සහ රැකවරණ සේවා සම්බන්ධයෙන් වඩා හොඳ ඇගයීමක් තිබීම

## නව ගුණාත්මක ඇගයීමේ ක්‍රමය

ජාතික ගුණාත්මක සම්මතයන් NQF හි කොටසකි. මේ මගින් ඕස්ට්‍රේලියාව පුරා සියළුම ළමුන්ගේ අධ්‍යාපන සහ රැකවරණ සේවා සම්බන්ධ වඩා ඉහළ මිනුම් ලකුණක් ඇති කෙරේ.

ඔබගේ සේවාව සම්බන්ධයෙන් මෙම එක් එක් ගුණාත්මක ක්ෂේත්‍ර හත සඳහා ඇගයීමක් සහ සමස්ථ ඇගයීමක් ලබාදේ.

1. අධ්‍යාපන වැඩසටහන සහ පරිචය
2. ළමුන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව
3. භෞතික පරිසරය
4. කාර්ය මණ්ඩල පිළියෙල කර ගැනීම
5. ළමුන් සමඟ ඇති සබඳතා
6. පවුල් සහ ප්‍රජා සමඟ ඇති හවුල්කාරිත්වය
7. නායකත්ව සහ සේවා කළමණාකරණය

## ජාතික ගුණාත්මක සම්මතයන්ට එරෙහිව ඇගයීම

ඔබගේ දරුවා ලබාගන්නා සේවාව සම්බන්ධයෙන් බොහෝ විට පහත සඳහන් මධ්‍යස්ථ ඇගයීම් තුනෙන් එක ඇගයීමක් ලැබෙනු ඇත.

ඇගයීමේ සහ තක්සේරු කිරීමේ ක්‍රමය සැලසුම් කර ඇත්තේ ගුණාත්මක අධ්‍යාපනය සහ රැකවරණය යනු කුමක්ද යන්න පවුල්වල අයට සහ ශික්ෂකයන්ට අවබෝධ කරගත හැකි ආකාරයටවේ. මේ මගින් ගුණාත්මකබව වැඩි දියුණුවී වර්ධනය වන අතර මෙය අඛණ්ඩව සිදුවන වැඩි දියුණුවීමකි.

සේවා මගින් සෞඛ්‍යය සහ ආරක්ෂාව ඉතා වැදගත් ලෙස සලකන බව ඔබට සහතික වශයෙන් දැනගත හැකිය. ඔබගේ දරුවාගේ ආරක්ෂාව සහ සෞඛ්‍යය සැම මොහොතකම වැදගත්වේ.

### සැලකිය යුතු ආකාරයේ වැඩිදියුණුවක් අවශ්‍යවේ

ගුණාත්මක ක්ෂේත්‍රයන් හතෙන් එකක් හෝ ව්‍යවස්ථාවෙන් කොටසක් සපුරාලන්නේ නොමැති සහ දරුවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ සුබසිද්ධිය සම්බන්ධ පිළිගත නොහැකි ආකාරයේ අවදානමක් ඇති සේවා.

මෙම ගැටළු විසඳීම සඳහා වහා පියවර ගනු ඇත.

### ජාතික ගුණාත්මක සම්මතයන් කරා කටයුතු කිරීම

සේවාව බොහෝ ක්ෂේත්‍රවල ජාතික ගුණාත්මක සම්මතයන් සපුරනවා විය හැකි මුත් ක්ෂේත්‍ර එකක් හෝ කිහිපයක් වැඩිදියුණු කරගත යුතු බවට හඳුනා ගෙන ඇත.

### ජාතික ගුණාත්මක සම්මතයන් සපුරා ඇත

සේවාව ජාතික ගුණාත්මක සම්මතයන් සපුරා ඇත.

සේවාව මගින් සියළුම ගුණාත්මක ක්ෂේත්‍රයන් හතෙහි ගුණාත්මක අධ්‍යාපනයක් සහ රැකවරණ ලබාදේ.

### ජාතික ගුණාත්මක සම්මතයන් අභිබවා ගොස් ඇත

අවම වශයෙන් ගුණාත්මක ක්ෂේත්‍ර හතෙන් හතරකවත් ජාතික ගුණාත්මක සම්මතයන්ට ඉහළින් සිටී.

### ඉතා විශිෂ්ඨය

සේවාව මගින් ඉතා විශිෂ්ඨ අධ්‍යාපන සහ රැකවරණ ප්‍රවර්ධනය කෙරේ, ආංශික නායකත්වය පෙන්නුම් කෙරේ, එමෙන්ම නිරන්තර වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් ඇප කැපවී සිටී.

මෙම ඇගයීම ලබාදිය හැක්කේ ACECQA මගින් පමණි.

ජාතික ගුණාත්මක සම්මතයන් අභිබවා ගිය බවට ඇගයීමට ලක්කල සේවා මගින් මෙම ඇගයීම සඳහා ඉල්ලා සිටිය හැකිය.

NQF සම්බන්ධ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා සහ එය ඔබට සහ ඔබගේ දරුවාට බලපාන ආකාරය දැනගැනීම සඳහා ඔබගේ සේවාව හා කථා කරන්න නැතිනම් ඕස්ට්‍රේලියානු ළමා අධ්‍යාපන සහ රැකවරණ ගුණාත්මක අධිකාරියේ (Australian Children's Education and Care Quality Authority (ACECQA)) වෙබ්අඩවිය වන

**www.acecqa.gov.au/families** වෙත යන්න.